# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

# 1. කුලී රථ සේවා භාවිතය

කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් වර්තමාන තත්ත්වය යටතේ, ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි කුලී රථවල ගමන් කරන මගීන්ගේ සංඛ්‍යාව අවම කළ යුතු අතර අනෙකුත් ආරක්ෂක පියවරයන් අනුගමනය කළ යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**කුලී රථ රියදුරන්**

- පවුලක් නම් මිස උපරිම මගීන් සංඛ්‍යාව දෙදෙනෙකුට සීමා වන බවට සහතික විය යුතුය.
- මගීන් ඉදිරිපස අසුනේ ගමන් නොකළ යුතුය.
- රිය පැදවීම සහ මගී ආසන අතර විනිවිද පෙනෙන ආවරණයක් සවි කරන්න.
- මුදල් පරිහරණය අවම කිරීම පිණිස ගාස්තු සඳහා නිශ්චිත මුදල ගෙන ඒමට හෝ අන්තර්ජාල ගෙවීම් සඳහා මගීන් දිරිමත් කරන්න.
- සෑම විටම ඔබ සමඟ ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් තබා ගන්න.
- හැකි නම් මගීන් සඳහා ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් සපයන්න.
- මගීන් නංවා ගැනීමේදී හෝ බැසීමේදී ඔවුන්ගේ පෞද්ගලික බැග් සහ බඩු බාහිරාදිය හැසිරවීමට මගීන්ගෙන් ඉල්ලා සිටීම සලකා බලන්න.
- මගී ප්‍රවාහනයේදී මෝටර් රථයේ වාතාශ්‍රය සඳහා ප්‍රතිචක්‍රීකරණය කළ වායු විකල්පය භාවිතා කිරීමෙන් වළකින්න; නැවුම් පිටත වාතය ගෙන ඒමට සහ / හෝ වාහන කවුළු පහත් කිරීමට මෝටර් රථයේ වාතාශ්‍රය භාවිතා කරන්න.
- වාහනයේ නිතර ස්පර්ශ වන පෘෂ්ටයන් පිරිසිදු කර විෂබීජහරණය කරන්න (අවම වශයෙන් සෑම ධාවන වාර 5 ක් අවසානයේම).
- සියලුම මගීන් මුහුණු ආවරණ පැළඳ සිටින බවට සහතික විය යුතුය.
- කුලී රථයට ඇතුළුවීමට පෙර සියලුම මගීන් ඇල්කොහොල් අඩංගු දෑත් පිරිසිදුකාරක යොදා ගනිමින් අත් පිරිසිදු කර ගත යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම අයිතිකරු/ රියදුරු ගේ වගකීම වේ.

**මගීන්**

- මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳිය යුතුය.
- ඉදිරිපස අසුනේ හිඳ නොගන්න.
- කුලී රථ ධාවනය අතරතුර ජංගම දුරකථනය ස්පර්ශ නොකිරීමට උත්සාහ කරන්න.
- නිතර ස්පර්ශ වන පෘෂ්ටයන් උදා. දොරවල් ආදිය අනවශ්‍ය ලෙස ස්පර්ශ නොකරන්න.
- සංචාරය අතරතුරදී මුහුණ ස්පර්ශ නොකරන්න. අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා ජලය සහිත කුලී රථයකින් ගමන් කිරීමෙන් පසු අත් සෝදන්න.
- මුදල් පරිහරණය නොකර හැකිනාක් වෙනත් ක්‍රම හරහා ගෙවන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ජනමාධ්‍ය.
- ජංගම දුරකථන යෙදුම (App) හරහා.
- නියමිත උපදෙස් කුලී රථය තුළ සංඥා/කෙටි විස්තර ලෙස ප්‍රදර්ශනය කිරීම.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.